LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# නව නීති සහ විධායක තීරණ පිළිබඳ යාවත්කාලීන කිරීම

# - 2026 ජුනි -

2026 ජූලි 05

LAW
TRACKER

# නව නීති සහ විධායක තීරණ - 2026 ජූනි

*2026 ජූලි 05*

## ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලිය




## 2026 ජූනි මාසයේ යාවත්කාලීන කිරීම්

### I. සහතිකය සටහන් කරන ලද පනත්

1. **2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** (2026 ජූනි 3 දින සහතිකය සටහන් කරන ලදී) - මෙමගින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කරයි. ඇතැම් මූල්‍ය ගනුදෙනු සඳහා බදුගෙවන්නා හඳුනාගැනීමේ අංක සහතිකය අනිවාර්ය කිරීම, ආදායම් ගණනය කිරීමේ සංශෝධිත නීති සහ නිශ්චිත ව්‍යාපෘති සහ ව්‍යාපාර සඳහා පැහැදිලි කරන ලද බදු නිදහස් කිරීම් හඳුන්වා දෙයි. ප්‍රාග්ධන ලාභ බද්ද පුද්ගලයන් සහ හවුල්කාරිත්වයන් සඳහා 15% දක්වා ද, භාර, ඒකක භාර, අන්‍යෝන්‍ය අරමුදල් සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා 10% දක්වා ද ඉහළ නංවයි. එ.ජ.ඩො. 250,000 සිට මිලියන 3.0 දක්වා වූ සුදුසුකම් ලබන ආයෝජන සඳහා 100% ක වැඩි දියුණු කළ ප්‍රාග්ධන දීමනාවක් හඳුන්වා දෙයි. විවිධ බලධාරීන්ට තොරතුරු අනාවරණය කිරීමේ විෂය පථය පුළුල් කරයි.

### II. ගැසට් පත්‍රයේ පළකරන ලද පනත් කෙටුම්පත්

1. **2026 අංක 40 දරන ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත** (2026 ජූනි 5 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් පුවත්පත් කලාවේදීන්, සංස්කාරකවරුන්, විකාශකයන්, අන්තර්ගතය තනන්නන්, ඡායාරූප ශිල්පීන් සහ අනෙකුත් මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීය ප්‍රමිති සකස් කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය ස්ථාපනය කරයි. ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සහ වසරක් ඇතුළත ඡන්දයක් පවත්වන තෙක් අමාත්‍යාංශ මට්ටමින් පත් කරන ලද අතුරු සභාවක් සහිත සාමාජිකයන් 15 දෙනෙකුගෙන් යුත් සභාවක් (ඡන්දයෙන් පත් වන 8 දෙනෙක් සහ පත්කරනු ලබන 7 දෙනෙක්) මගින් මෙම ආයතනය පාලනය කරනු ලැබේ. සාමාජිකයින් බඳවා ගැනීම සහ විනය, විභාග පැවැත්වීම, පුහුණු කිරීම්, ප්‍රතීතනය සහ නීති සකස් කිරීම මෙම ආයතනයේ බලතලවලට ඇතුළත් වේ. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ උපලේඛනගත ආයතනයක් ලෙස නම් කර ඇත; විගණකාධිපතිවරයා විසින් ආයතනයේ ගිණුම් විගණනය කරනු ලබන අතර, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.
2. **2026 අංක 42 දරන සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 ජූනි 11 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් 1958 අංක 29 දරන සත්ව පනත යටතේ දක්වා ඇති 'සතකු' යන්නෙහි අර්ථ දැක්වීම එළ හරකකු හෝ මී හරකකු යන්නට අමතරව එළුවකු, ඌරකු හෝ බැටළුවකු යන්න ද ඇතුළත් වන සේ පුළුල් කරන අතර, පනතෙහි පවතින නියාමන විධිවිධාන මෙම අමතර සත්ව විශේෂ තුනට ද අදාළ වන සේ පුළුල් කරනු ලැබේ.
3. **2026 අංක 44 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 ජූනි 25 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතෙහි 7, 13 සහ 20(අ) වෙනි වගන්ති යටතේ දක්වා ඇති වැරදි සඳහා වන දඩය රු. 10,000 සිට රුපියල් රු. 100,000 දක්වා ඉහළ නංවයි. වැඩි කළ දඩය අදාළ වන්නේ මෙම සංශෝධිත නීතිය බලාත්මක වන දිනට පසුව සිදු කරනු ලබන වැරදි සඳහා පමණි; එයට පෙර සිදුකරන ලද වැරදි පෙර නියම කර තිබූ දඩුවම් වලට යටත් වේ.
4. **2026 අංක 45 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 ජූනි 25 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතෙහි 'අධ්‍යක්ෂ' යන තනතුරු නාමය සඳහන් සෑම තැනකම ඒ වෙනුවට 'අධ්‍යක්ෂ ජනරාල්වරයා' යන නාමය ආදේශකර, 'අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා' යන නව තනතුර හඳුන්වා දෙයි. සහල්, එළවළු, පලතුරු, අල භෝග සහ වෙනත් අතිරේක ආහාර භෝග හැර, අපනයන විභවයක් සහිත ඕනෑම භෝගයක් අදහස් වන පරිදි 'අපනයන කෘෂිකර්ම භෝග' යන්නෙහි අර්ථ දැක්වීම සංශෝධනය කරනු ලබන අතර, සුදුසුකම් ලබන්නේ කුමන භෝග වර්ගද යන්න තීරණය කිරීමේ බලය අමාත්‍යවරයාට පවරනු ලැබේ.
5. **සංස්ථාගත කිරීමේ පනත්**

- **2026 අංක 41 දරන ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත** (2026 ජූනි 11 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී)

- **2026 අංක 43 දරන ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත** (2026 ජූනි 15 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී)
- **2026 අංක 46 දරන ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 ජූනි 26 දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී)

## III. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන

6. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 11 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි, මධ්‍ය කාලීන මූල්‍ය රාමුව, අරමුණු, රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ අවදානම් හෙළිදරව් කිරීම් නිශ්චිතව දක්වා ඇති 2027 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 22)

7. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතෙහි 25 වන වගන්තිය ප්‍රකාරව, 2025 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ණය මෙහෙයුම් සහ රාජ්‍ය ණය ශේෂයන් පිළිබඳ තොරතුරු ඇතුළත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ 2025 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 22)

8. ආසන්න වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 255 ක් සහ ආචාර්ය උපාධි පාඨමාලා 16 ක් සඳහා ශිෂ්‍යත්ව අවස්ථා සපයා දෙමින්, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනක් තවදුරටත් ක්‍රියාත්මක කරමින්, ජපන් යෙන් මිලියන 282 ක (ආසන්න වශයෙන් රු.මි. 575 ක) මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ජපානය විසින් 2026 වර්ෂය සඳහා පිරිනමනු ලබන ප්‍රදානය ලබා ගැනීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

9. 2026 මාර්තු මාසයේදී අනුමත කරන ලද, ආසියානු සංවර්ධන බැංකුවේ එ.ජ.ඩො.මි. 380 ක ප්‍රතිපත්ති පාදක ණය පැකේජය තුළ වෙළඳ, ආයෝජන සහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන (උප වැඩසටහන 1) සඳහා අනුමත කරන ලද එ.ජ.ඩො.මි. 100 ක ණය මුදල එ.ජ.ඩො.මි. 100 ක අතිරේක මූල්‍යකරණයක් මගින් පුළුල් කරමින්, එම උප වැඩසටහන සඳහා වෙන් කරන ණය මුදල එ.ජ.ඩො.මි. 200 දක්වා වැඩි කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

10. දිට්වා සුළි කුණාටුවෙන් (2025 නොවැම්බර්) පසුව යථා තත්ත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය කරන ඇස්තමේන්තුගත එ.ජ.ඩො. බිලියන 3.5 ක මුළු අවශ්‍යතාවයෙහි කොටසක් ලෙස මහාමාර්ග සහ වාරිමාර්ග යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ ජීවනෝපාය සහ නිවාස ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අරමුදල් සැපයීම පිණිස ආසියානු සංවර්ධන බැංකුවෙන් එ.ජ.ඩො.මි. 200 ක අරමුදල් ලබා ගැනීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

11. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 51 වන වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, 2025 වසරේ ආර්ථික ප්‍රවණතා, රජයේ ආදායම සහ වියදම, මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය, අයවැය හිගය මූල්‍යනය කිරීම සහ ණය ව්‍යුහය පිළිබඳ විස්තර ඇතුළත් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15).

12. රේගු ආනයන බදු කාණ්ඩ හතරක් ලෙස (0%, 10%, 20%, 30%) ප්‍රතිව්‍යුහගත කිරීම සඳහාත්, දේශීය කෘෂිකර්මාන්තයට සහ කර්මාන්ත වලට අදාළ උපබෙදුම් රේගු සංකේතාංක හඳුන්වා දීම සඳහාත් අංක 01/2026 දරන ආදායම් සංරක්ෂණ ආඥාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15).

13. 2026 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (මොන්ට්‍රියල් සම්මුතිය යටතේ වන ශ්‍රී ලංකාවේ බැඳීම්වලට අනුව, 2026 ජූනි 6 දින සිට බලපැවැත්වෙන පරිදි හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC) සමග පමණක් ක්‍රියාකරන උපකරණ සහ 2028 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC) සමග පමණක් ක්‍රියාකරන සම්පීඩක ආනයනය තහනම් කිරීම) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 1)

14. ලංකා බැංකුව සඳහා වසර 22 ක් පැරණි පද්ධතියක් ප්‍රතිස්ථාපනය කරමින්, එම බැංකුවේ අරමුදල් සැපයීම මත, වසර 5 ක කාලයක් සඳහා එ.ජ.ඩො.මි. 10 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ නව ප්‍රධාන බැංකු පද්ධතියක් (Core Banking System) ප්‍රසම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 30)

15. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වාහන හිගය පියවා ගැනීම සඳහා රජයේ ක්ෂේත්‍ර සහ සංවර්ධන මෙහෙයුම් සඳහා ට්‍රැක්ටර් 175 ක්, ගලි බවුසර් 100 ක්, බැකෝ යන්ත්‍ර 100 ක් සහ ටිපර් රථ 160 ක් ප්‍රසම්පාදනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

16. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ප්‍රකාරව, 'වඩා හොඳින් නැවත ගොඩනැගීම' යන ප්‍රතිපත්තිය යටතේ අනුමත කරන ලද, දිට්වා සුළි කුණාටු ප්‍රතිසාධන ව්‍යාපෘති 1,028 ක් (රු. මිලියන 515,460.26) සහ අතිරේක පළාත් සභා ව්‍යාපෘති 38 ක් (රු. මිලියන 102,219.05) අනුමත කරන ලදී. (2026 ජූනි 30)

17. යටිතල පහසුකම්, සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, ජල සැපයුම සහ ආපදා කළමනාකරණය ආවරණය වන පරිදි, 'සාගර් බන්ධු මෙහෙයුම' යටතේ එ.ජ.ඩො.මි. 350 ක ණය සහ එ.ජ.ඩො.මි. 100 ක ප්‍රදාන වලින් සමන්විත වන, පශ්චාත් දිට්වා සුළි කුණාටු ප්‍රතිසාධනය සඳහා වන එ.ජ.ඩො.මි. 450 ක ඉන්දියානු සහන පැකේජය අනුමත කරන ලදී. (2026 ජූනි 30)

18. ජාතික සෞඛ්‍ය සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම පිණිස සහ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජා සහ සෞඛ්‍ය සමීක්ෂණය 2026/2027 පැවැත්වීම අනුමත කරන ලදී; අවසන් වරට එවැනි සමීක්ෂණයක් පවත්වන ලද්දේ 2016 වර්ෂයේ දී ය. (2026 ජූනි 8)

19. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2021 වර්ෂයේ දී නිකුත් කරන ලද නියෝග අවලංගු කරමින් ඒ වෙනුවට සාදන ලද පහත සඳහන් නව නියෝග තුන ප්‍රකාශයට පත්කිරීම අනුමත කරන ලදී: ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි සිදුකරන ආයෝජන පිළිබඳ නියෝග, විගාමිකන් විසින් විදේශයන්ට අරමුදල් මාරු කිරීම පිළිබඳ නියෝග සහ අලුත් කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ සීමා පිළිබඳ නියෝග. (2026 ජූනි 8)

20. 'ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය' වැඩසටහනෙහි කොටසක් ලෙස, රේගු ආඥා පනත සමාලෝචන කමිටුව විසින් මාස හතක කාලයක් පුරා පාර්ශවකරුවන් සමග සිදුකරන ලද සාකච්ඡා පදනම් කරගෙන, රේගු ආඥාපනත සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දෙන ලදී. (2026 ජූනි 8)

### ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන

21. ජාත්‍යන්තර සංවර්ධන ආයතනවල සහාය ඇතිව, ප්‍රවාහන ධාරිතාව වැඩිදියුණු කිරීම, ගමන් කාලය අඩු කිරීම සහ තිරසාර ප්‍රවාහන සේවාවකට සහාය වීම පිණිස මරදාන-රාගම (ප්‍රධාන මාර්ගය), මරදාන-මාකුඹුර (කැළණි වැලි මාර්ගය) සහ මරදාන-පානදුර (මුහුදුබඩ මාර්ගය) යන ඉහළ ඝනත්වයක් සහිත කොරිඩෝ තුන සඳහා දුම්රිය මාර්ග විද්‍යුත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

22. මධ්‍යම අධිවේගී මාර්ගයේ 4 වන අදියරෙහි කි.මී. 38.5 දිගකින් යුත් අදියර 1 කොටස (කුරුණෑගල සිට ගලේවෙල දක්වා, කි.මී. 78+000 - 116+500) රජයේ අරමුදල් භාවිතා කරමින් දේශීය කොන්ත්‍රාත්කරුවන් හරහා ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදනය සිදු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 30)

23. 2022 වර්ෂයේ ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියේ 70% ක ප්‍රගතියකින් පසුව ඇණහිට තිබූ යාපනය මහ නගර සභා ගොඩනැගිල්ලෙහි දෙවන අදියරෙහි ඉදිකිරීම් මුල් කොන්ත්‍රාත්කරු හරහා රු.මි. 1,958.85 ක (බදු හැර) සංශෝධිත පිරිවැයක් මත නිමකර යාපනය මහ නගර සභාවට භාරදීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

24. මැදපෙරදිග ගැටුම් හේතුවෙන් ඉන්ධන පිරිවැය ඉහළ යාම, ඇමරිකානු ඩොලරයේ අගය මත පදනම් වූ අමතර කොටස් පිරිවැය, අධිවේගී මාර්ගවල බස් රථ මෙහෙයුම් සහ නව මෙට්‍රෝ බස් රථ සේවා සැලකිල්ලට ගනිමින් ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව, 2026 ජූනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධනයෙන් පසුව බස් ගාස්තු සංශෝධනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

25. 'නගර 10 සංවර්ධන වැඩසටහන' යටතේ ඒ හා සම්බන්ධව අනුරාධපුරය, කතරගම, කොළඹ සහ මහනුවර ආවරණය වන පරිදි රු.මි. 325 ක නගර සන්නාමකරණ අධ්‍යයනයක් සහිතව යාපනය, මාතලේ, හැටන්, මඩකලපුව, හලාවත, තඹුත්තේගම, වවුනියාව, ඇහැලියගොඩ, බදුල්ල සහ මාතර යන නගර 10 පුරා ප්‍රමුඛතාගත කරන ලද සංවර්ධන ව්‍යාපෘති 217 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 1,475 ක් වෙන්කර දීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

26. 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ ආරම්භක අදියරේදී කුඩා නගර 23 න් සෑම නගරයකම එක් අත්‍යවශ්‍ය සංවර්ධන ක්‍රියාකාරකමක් බැගින් ක්‍රියාත්මක කරමින් 'මිතුරු පුරවර' කුඩා නගර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 581 ක් ලබා දීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

27. කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ පෑලියගොඩ, කෙරවලපිටිය, සීදූව සහ ජා-ඇල අන්තර් හුවමාරු සහ සම්බන්ධක නිදහස් මාර්ග කොටස් ආවරණය වන පරිදි මාර්ග ආලෝකකරණය (විනාශකාරී ක්‍රියා සහ සොරකම් කිරීම් හේතුවෙන් දැනට ආසන්න වශයෙන් 85% ක් අක්‍රිය තත්ත්වයේ පවතියි) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මි. 1,098.50 ක් අනුමත කරන ලදී. (2026 ජූනි 1)

28. විසල් හම්බන්තොට සංවර්ධන සැලැස්මේ මධ්‍යම වාණිජ කලාපය තුළ කර්මාන්ත, බහාලුම් සහ සැපයුම් යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සඳහා හම්බන්තොට, කෙලියපුර පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති අක්කර 108 ක ඉඩමක් ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීම හරහා වසර 50 ක කාලයක් සඳහා බදු දීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

29. බදුල්ල-හාලි-ඇල මාර්ගයේ දිට්වා සුළි කුණාටුවෙන් හානි වූ කිලෝමීටර් 1.5 ක කොටසක් ඇතුළුව කිලෝමීටර 6 ක කොටසක් (කිලෝමීටර් 115-121) එ.ජ.ඩො.මි. 2.4 ක ණය අතිරික්තයක් භාවිතා කරමින් රු.මි. 600 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ප්‍රතිසංස්කරණය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

30. බේස්ලයින් මාර්ගය පුළුල් කිරීමේ III වන අදියර සඳහා ඉඩම් අත්පත් කර ගැනීමෙන් අවතැන් වූ පවුල් සඳහාත් (සරසවි උයනේ මේ වන විටත් ඒකක 29 ක් වෙන්කර ඇති අතර විශේෂ තත්වයන් සඳහා තවත් අමතර ඒකක 8 ක් වෙන්කිරීම), කොලොන්නාව ප්‍රදේශයේ ගංවතුරට ගොදුරු වන පවුල් සඳහාත් (සංහිඳ සෙවණ නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ඒකක 336 ක් වෙන්කිරීම) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ භූගත නල මාර්ග මත අනවසරයෙන් පදිංචි පවුල් සඳහාත් (හෙළමුතු සෙවණ නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ඒකක 72 ක් වෙන් කිරීම) නැවත පදිංචි කිරීමේ පැකේජ අනුමත කරන ලදී. (2026 ජූනි 15)

31. 2026 වර්ෂයේ අයවැය මගින් 'මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය' යටතේ වෙන්කළ ප්‍රතිපාදන වලින් අරමුදල් සපයා ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් මාර්ග සංඥා ස්ථාපනය කිරීම, ආරක්ෂක වැට ඉදිකිරීම, මාර්ග සලකුණු යෙදීම සහ වේගය සීමාකරන බාධක යෙදීම ඇතුළත් ජාතික නොවන මාර්ගවල අනතුරුදායක ස්ථානවල මාර්ග ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

32. හරිත විශ්ව විද්‍යාලය, තාක්ෂණ පීඨ සහ පර්යේෂණ ආයතන සඳහා සහාය වනු පිණිස හෝමාගම/පිටිපන/මාහේනවත්ත 'තාක්ෂණ නගර ව්‍යාපෘතිය' (අක්කර 236, ආසන්න වශයෙන් දෛනිකව 50,000 පමණ ජනතාවක් පැමිණෙති) සඳහා උපකාරී වන පිටිපන-තලගල මාර්ගය පුළුල් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 8)

### කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග

33. 2026/27 මහ කන්නය සඳහා ඇස්තමේන්තුගත යූරියා මෙට්‍රික් ටොන් 169,635 ක අවශ්‍යතාවය සපුරාලීම සඳහා ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැණි ලිමිටඩ් වෙත ජාත්‍යන්තර තරගකාරී ටෙන්ඩරයක් හරහා ප්‍රිල්ඩ් යූරියා මෙට්‍රික් ටොන් 10,000 ක් සහ ග්‍රැනියුලා යූරියා මෙට්‍රික් ටොන් 10,000 ක් ප්‍රසම්පාදනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

34. 2026 වර්ෂයේ යල කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා අරමුදල් සැපයීම පිණිස රු.මි. 6,000 ක් ලබා දීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

35. විශේෂඥ කමිටුවක් විසින් සකස් කරන ලද සහ නීතිපතිවරයා විසින් අනුමත කරන ලද සත්ව සුභසාධන නැමති පනත් කෙටුම්පතේ කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 22)

36. රට පුරා තිබෙන්නේ යැයි ඇස්තමේන්තුකර ඇති මිලියන 16 ක් පමණ වූ මුළු ඉඩම් කැබලි ප්‍රමාණයෙන්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතුව ඇති ඉඩම් ලේඛනයෙහි ඇතුළත් දෘඪ පිටපත් සැලසුම් මිලියන 3.5 ක් අංකිතකරණය (Digitisation) කර ඉඩම් තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 1)

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය

37. හොරණ දිස්ත්‍රික් මහ රෝහල (ඇඳන් 544 ක් සහිත, කළුතර, කොළඹ සහ රත්නපුරය යන දිස්ත්‍රික්කවල ආසන්න වශයෙන් මිලියනයක පමණ ජනතාවට සේවය සපයන) සියලු භෞතික හා මූල්‍ය වත්කම් සමග බස්නාහිර පළාත් සභාවේ පරිපාලනයෙන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

38. රු.මි. 1,094.22 ක සංශෝධිත පිරිවැයක් යටතේ, ඉදිකිරීම් නිම කළ යුතු දිනය 2027 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර, ව්‍යුහය නැවත සැලසුම් කර (මුලින් තිබූ සෘණ පීඩන ඒකලන කාමර 50 ඒකලන කාමර 23 ක් සහ ඇඳන් 25 ක් සහිත පිරිමි වාට්ටුවක් සහ ඇඳන් 20 ක් සහිත කාන්තා වාට්ටුවක් ලෙස) මහනුවර ජාතික රෝහලේ සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකර නිම කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

39. වයස අවුරුදු පහට අඩු ළමයින් අතර දුර්වල සනීපාරක්ෂාව, අධික සීනි සහ ලුණු පරිභෝජනය, ඩිජිටල් තිරවලට ඇබ්බැහි වීම සහ ශාරීරික අක්‍රියතාවය ඉලක්ක කර ගනිමින් සමාජ සහ චර්යාත්මක වෙනසක් ඔස්සේ ළමා සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා වූ ජාතික සන්නිවේදන වැඩසටහන (යුනිසෙෆ් සංවිධානයේ සහාය ඇතිව) දිවයින පුරා ව්‍යාප්ත කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

40. දේශීය දානපතියන්ගේ සම්පූර්ණ අරමුදල් සැපයීම මත, රු.මි. 64.15 ක ඇස්තමේන්තුගත වියදමකින් රත්නපුර ශික්ෂණ රෝහලේ නව ළමා වාට්ටු සංකීර්ණයේ සිව්වන මහලෙහි ළමා දැඩි සත්කාර ඒකකයක් ඉදිකිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

### පරිසර

41. 2026 වර්ෂය අග භාගයේ දී ඇතිවනු ඇතැයි අපේක්ෂා කරන එල් නිනෝ තත්ත්වයන් තුළ ජලය, විදුලිය සහ ආහාර සුරක්ෂිතතා අවදානම් කළමනාකරණය කිරීම සඳහා කැබිනට් අනු කමිටුවක් (පරිසර අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් යුතු) සහ සහායක නිලධාරී කමිටුවක් පත්කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

42. 2024 වර්ෂයේ පවත්වන ලද සංගණනයට අනුව වන අලි 7,450 ක් පමණ සිටින අතර, මෙරට දිස්ත්‍රික්ක 25 න් දහනවයකට (19) බලපාන අලි-මිනිස් ගැටුම් විසඳීම සඳහා 2020 වර්ෂයේ සකස් කරන ලද සැලැස්ම යාවත්කාලීන කරමින් අලි-මිනිස් ගැටුම් කළමනාකරණය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

43. හඳපානාගල-දෙමෝදර අලි කොරිඩෝව (මොණරාගල දිස්ත්‍රික්කය) අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම; වැටහිරකන්ද ස්වභාවික රක්ෂිතය වනජීවී කොරිඩෝවක් ලෙස නැවත ප්‍රකාශයට පත් කිරීම; සහ කොහොලන්කළ (හම්බන්තොට) අලිමංකඩ අවහිරවන සේ ඉදිකිරීම් කර ඇති ඉඩම් අත්පත් කර ගෙන හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතයේ කොටසක් ලෙස ප්‍රකාශයට පත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

44. සහායක ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම සහ ෆයිබර්ග්ලාස් අපද්‍රව්‍ය සඳහා නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම හඳුන්වා දීම සඳහා ධීවර හා ජලජ සම්පත් පනත සහ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම ඇතුළත් වෙරළබඩ කලාප සහ ධීවර වරාය අපද්‍රව්‍ය කළමනාකරණ යෝජනා රාමුව අනුමත කරන ලදී. (2026 ජූනි 1)

45. ආසන්න නැව් මාර්ගවල දිනකට යාත්‍රා 400 ට අධික සංඛ්‍යාවක් ගමන් කිරීම හේතුවෙන් ඇතිවන සමුද්‍ර දූෂණ අවදානම ආමන්ත්‍රණය කරමින්, අන්තරායකාරී සහ හානිකර ද්‍රව්‍ය ද ඇතුළත් වන පරිදි යාවත්කාලීන කරන ලද ජාතික තෙල් කාන්දු හදිසි සැලැස්ම සහ ඒ සමග ඇති ඩිජිටල් වේදිකාව (අදියර 1 සකස් කර ඇත) ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

46. පවතින දේශගුණික විපර්යාස, තිරසාර සංවර්ධන ඉලක්ක සහ පැරිස් ගිවිසුම යටතේ වන බැඳීම් වලට අනුකූල වන පරිදි, නිර්ණායක 76 ක් (පාරිසරික 31, සමාජීය 30, පාලන 15) සහ වාර්තාකරණ මට්ටම් පහක් සමගින් යාවත්කාලීන කරන ලද ජාතික හරිත වාර්තාකරණ පද්ධති මාර්ගෝපදේශ; සහ සාමාජිකයින් 24 දෙනෙකුගෙන් යුත් ජාතික හරිත වාර්තාකරණ මෙහෙයුම් කමිටුවක් නැවත ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

47. 2017 සහ 2021 වර්ෂවලදී ආරම්භ කරන ලද කෙටුම්පත් කිරීමේ කටයුතු පදනම් කර ගෙන, ජෛව සුරක්ෂිතතා පනත් කෙටුම්පත (කාර්ටිජිනා සම්මුතිය යටතේ ජෛව විවිධත්වයට සහ මානව සෞඛ්‍යයට ජාන විකරණය කරන ලද ජීවීන් මගින් ඇතිවිය හැකි බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා) සකස් කර අවසන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 8)

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

48. බස්නාහිර, දකුණ, සබරගමුව, නැගෙනහිර සහ වයඹ පළාත්වල පාසල්වලට පැමිණෙන දේශීය නිෂ්පාදකයින් මගින් හෝ අනෙකුත් පළාත්වල විවෘත වෙළඳපොළෙන් මාරුකර ගත හැකි රු. 3,000 ක ත්‍යාග වවුචරයක් ලබා දෙමින් සුදුසුකම් ලත් පාසල් සහ පිරිවෙන් සිසුන් සඳහා පාසල් සපත්තු සපයාදීමේ වැඩසටහන 2027 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 30)

49. විනිවිදභාවය සහ සමාන ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ, මානව හිමිකම් කොමිෂන් සභාවේ සහ අධ්‍යාපන බලධාරීන්ගේ යෝජනා ඇතුළත් කරමින් 2027 වර්ෂයේ සිට රජයේ පාසල්වල 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා සකස් කරන ලද නව චක්‍රලේඛය අනුමත කරන ලදී. (2026 ජූනි 22)

50. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වනු ලබන විභාග 300 ට අධික සංඛ්‍යාවක් සඳහා සියලුම ශාඛා විසින් සිදු කරනු ලබන දත්ත අතින් මෙහෙයවීමේ ඛණ්ඩනය වී ඇති ක්‍රමය ප්‍රතිස්ථාපනය කරමින් එම දෙපාර්තමේන්තුව සඳහා ඒකාබද්ධ කරන ලද පරිගණක ජාලයක් ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

51. පැරණි පාසල් නේවාසිකාගාර ගොඩනැගිලි 126 ක් වැඩිදියුණු කිරීම සහ භෞතික, සනීපාරක්ෂක, සෞඛ්‍ය සහ සුරක්ෂිතතා තත්ත්වයන් වැඩිදියුණු කිරීම ඇතුළත් පාසල් නේවාසිකාගාර නවීකරණ ව්‍යාපෘතිය (2026-2028, ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1,008) අනුමත කරන ලදී. (2026 ජූනි 15)

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන

52. අනවසර ඉඩම් අත්පත් කර ගැනීම නැවැත්වීම සඳහා විශේෂ පොලිස් ඒකකයක් (නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත්) ස්ථාපනය කිරීම, ප්‍රජා සංවර්ධනය සඳහා භාවිතයට නොගත් මහවැලි අධිකාරියේ ඉඩම් ගොඩකිරීම සහ වෙරළබඩ හෝටල් මෙහෙයුම් විනිවිදභාවයෙන් යුතුව අධීක්ෂණය කිරීම සඳහා රාමුවක් සහිතව, නීති විරෝධී ඉඩම් අත්පත් කර ගැනීම් සහ අනවසර වෙරළබඩ ඉදිකිරීම් ආමන්ත්‍රණය කිරීම පිණිස 'නැගෙනහිර පළාතේ ඉඩම් ආරක්ෂා කිරීම' සඳහා වන විශේෂ කමිටුවක් ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

53. සුනඛ ගහනය පාලනය කිරීම, ජලභීතිකා එන්නත අනිවාර්ය කිරීම සහ සුනඛයින් ලියාපදිංචි කිරීම සහ ආයතනික වගකීම් ශක්තිමත් කිරීම සඳහා ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඒකාබද්ධ කර සකස් කරන ලද පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 30)

54. පළාත් පාලන මැතිවරණයෙන් පසු නියෝජ්‍ය නගරාධිපති හෝ නියෝජ්‍ය සභාපති ලෙස සේවය කරන රාජ්‍ය නිලධාරීන් සඳහා වැටුප් රහිත නිවාඩු (දැනට පවතින මාසයකට දින හයක වැටුප් සහිත නිවාඩු ඉක්මවමින්) ලබා දීමට ඉඩ සලසමින් ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

55. මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය 127 දෙනෙකුට සහ දෛනිකව පැමිණෙන 1,500 ට අධික ජනතාවට පහසුකම් සැලසීම පිණිස, අවුරුදු 50 ක් පමණ පැරණි ගොඩනැගිලි දෙකක් ඉවත්කර ඒ වෙනුවට මහල් හතරකින් සමන්විත නව මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් (ගම්පහ දිස්ත්‍රික්කය) ඉදිකිරීම සඳහා රු.මි. 398.60 ක් අනුමත කරන ලදී. (2026 ජූනි 15)

56. 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ 2026 වර්ෂය තුළ පළාත් පාලන බල ප්‍රදේශ 24 ක් පුරා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 150 ක් අනුමත කරන ලදී. (2026 ජූනි 8)

## ඩිජිටල් ආර්ථික

57. අනුමත සංකල්ප පත්‍රිකාවක් පදනම් කර ගෙන, ඩිජිටල් ප්‍රතිපත්ති, නියාමනය සහ කෘතිම බුද්ධිය ආශ්‍රිත නවෝත්පාදන සහාය සඳහා නව ආයතනික රාමුවක් ස්ථාපනය කරමින් ආර්ථික සංවර්ධන පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම අනුමත කරන ලදී. (2026 ජූනි 8)

## බලශක්ති

58. ශ්‍රී ලංකාව සතුව ඇතැයි ඇස්තමේන්තු කර ඇති ගිගාවොට් 56 ට අධික අක්වෙරළ සුළං විභවය උපයෝගී කරගැනීම සඳහා වන ජාතික හරිත හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය සඳහා මාර්ග සිතියමක්, කාර්ය ප්‍රවාහය සහ රෙගුලාසි සකස් කර එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 8)

59. මුල්ලිකුලම් සුළං බල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියේ ලොට් A ව්‍යාපෘතියේ ග්‍රිඩ් උපපොළ බහනු වැඩ සහ 220kV සම්ප්‍රේෂණ රැහැන් බහනු දෙකක් ඇතුළත් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් එ.ජ.ඩො.මි. 6.04 ක සහ රු.මි. 499.66 ක (එකතු කළ අගය මත බදු රහිත) මිලකට ඉන්දියාවේ RS Infraprojects Pvt. Ltd. වෙත ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

60. සපුගස්කන්ද විදුලි බලාගාරයේ A බලාගාරය සඳහා Lanka IOC PLC සමාගම වෙත ද (එකතු කළ අගය මත බද්ද ඇතුළුව රු.මි. 392.47) B බලාගාරය සඳහා Chevron Lubricants Lanka PLC සමාගම වෙතද (එකතු කළ අගය මත බද්ද ඇතුළුව රු.මි. 434.86) 2026/27 වර්ෂයේ ලිහිසි තෙල් සැපයුම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

## වරාය සහ සිවිල් ගුවන් සේවා

61. සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ලංකා සමාගමෙහි ප්‍රාග්ධන අයවැයෙන් අරමුදල් සපයන, රු.මි. 1,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ රත්මලානේ පැරණි ගගන නාවික පණිවිඩ හැසිරවීමේ පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව ගගන නාවික පණිවිඩ හැසිරවීමේ පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

62. ඉන්දියාවේ දිල්ලි ගුවන්තොටුපළේ ශ්‍රී ලංකන් ගුවන් සේවය සඳහා භූමි සහ ගුවන් මගීන් හැසිරවීමේ සේවා කොන්ත්‍රාත්තුව වසර තුනක කාලයක් සඳහා (2026 ජූනි 1 සිට 2029 මැයි 31 දක්වා) සීමිත ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමක් හරහා තෝරා ගන්නා ලද Bird Flight Services (India) Pvt Ltd සමාගම වෙත රු.මි. 332.85 ක මිලකට ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

63. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ සාමාජික රටවල් 41 නියෝජිතයන් 80 දෙනෙක් පමණ සහභාගී වන ආසියා ශාන්තිකර සහයෝගීතා ගුවන් සේවා ආරක්ෂක වැඩසටහනේ 21 වන මෙහෙයුම් කමිටු රැස්වීම (2026 ජූනි 23-24) සහ 14 වන ආසියා සහ ශාන්තිකර කලාපීය ගුවන් සේවා ආරක්ෂක සම්බන්ධීකරණ සංසදය (2026 ජූනි 25-26) පැවැත්වීම සඳහා සත්කාරකත්වය සැපයීම අනුමත කරන ලදී. ශ්‍රී ලංකාව 2026-2027 වර්ෂය සඳහා ආසියා ශාන්තිකර සහයෝගීතා ගුවන් සේවා ආරක්ෂක වැඩසටහනේ සභාපතිත්වය දරයි. (2026 ජූනි 15)

64. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන සේ තීරුබදු රාමුව සකස් කරමින්, 2008 ශ්‍රී ලංකා-තුර්කි ගුවන් සේවා ගිවිසුමේ 11 වන වගන්තියේ (තීරුබදු) සංශෝධනය අත්සන් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

### නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන

65. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සැපයීම මත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ සකස් කරන ලද, සියලුම ජල සේවා සැපයුම්කරුවන් සහ සනීපාරක්ෂක සේවා සැපයුම්කරුවන් සඳහා අදාළ වන පරිදි ගාස්තු නියම කරමින්, මිල දැරිය හැකි ප්‍රවේශයක් සහිතව මූල්‍ය තිරසාරභාවය සමතුලිත කිරීම සඳහා රාමුවක් ස්ථාපනය කරමින් සකස් කරන ලද ජාතික ජල ගාස්තු ප්‍රතිපත්තිය අනුමත කරන ලදී. (2026 ජූනි 8)

66. පවුල් 600,000 ක් පමණ ඉලක්ක කර ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හරහා කුඩා නගර සහ ග්‍රාමීය ප්‍රදේශ 50 ක් පුරා ජල සැපයුම් ව්‍යාපෘති 300 ක් ක්‍රියාත්මත කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

67. තඹුත්තේගම-රාජාංගනය මහා මාර්ගයේ ගංවතුර අවදානමට ලක් වන ස්ථානයක පිහිටි පැරණි ගිනිපෙට්ටි පාලම වෙනුවට රු.මි. 241.45 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් දිය මං ආකාරයේ පාලමක් ඉදිකිරීම් සඳහා නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කරන ලදී. (2026 ජූනි 15)

### අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා

68. 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ පිහිටුවන ලද නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යභාරය, නීති අයිතිවාසිකම් සහ පිළියම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා ජූලි 6 වන දිනය ශ්‍රී ලංකාවේ ජාතික නීති ආධාර දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

69. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ දූෂණ විරෝධී (මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය හරහා වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීම) නියෝග 2026 සහ දූෂණ විරෝධී (ඉහළ අවදානම් කාණ්ඩ) නියෝග 2026 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූනි 8)

### කම්කරු

70. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රශස්ත පිළිවෙත්වලට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදලේ (මිලියන 2.5 ට අධික සාමාජිකයන් සහ ට්‍රිලියන 4.9 ක වත්කම් සහිත) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ (මිලියන 3 ට අධික සාමාජිකයන් සහ බිලියන 637.5 වත්කම් සහිත) සියලුම මෙහෙයුම් එක් ඒකාබද්ධ ත්‍රෛපාර්ශවීය පාලන රාමුවක් (රජය, සේවා යෝජකයන්, සේවකයින්) යටතට ගෙන ඒමේ ශක්‍යතාවය පරීක්ෂා කර බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 15)

### බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු

71. බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගම්වලට අයත් ආගමික ස්ථාන 178 ක් ආවරණය වන පරිදි දැනටමත් වෙන්කර ඇති රු.මි. 800 ක ප්‍රතිපාදන යටතේ, සුළි කුණාටුවෙන් හානි වූ තවත් ආගමික ස්ථාන 90 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මි. 129.69 ක් අනුමත කරන ලදී. (2026 ජූනි 15)

72. 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද, පෙර වෙන් කරන ලද රු.මි. 226.18 න් රු.මි. 141.54 ක් පමණක් භාවිතා කර ඇති, අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ මධ්‍යස්ථානය (අමරදේව අසපුව) සම්පූර්ණ කිරීම සඳහා අතිරේක රු.මි. 113.17 ක් අනුමත කරන ලදී. (2026 ජූනි 1)

### විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක

73. නැවත නැවත සංක්‍රමණය වීම සහ ළමයින්ගේ සුභසාධනය සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස, ආර්ථික මග පෙන්වීම, ළමා සෞඛ්‍යය සහ ආරක්ෂාව, කාන්තා කටයුතු, රැකියා පුහුණුව, කුඩා ව්‍යාපාර සහාය සහ අපනයන සංවර්ධනය ආවරණය වන පරිදි කාන්තා සංක්‍රමණික සේවිකාවන්ගේ පවුල් සඳහා පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් අනුමත කරන ලදී. (2028 ජූනි 8)

74. ජපානයේ නව 'නිපුණතා සංවර්ධනය සඳහා රැකියා වැඩසටහන' (2027 අප්‍රේල් 1 සිට ක්‍රියාත්මක වන) යටතේ සේවක ආරක්ෂාව සහ නිශ්චිත කුසලතා සහිත සේවක තත්ත්වය ලබා ගැනීමේ මාර්ගයක් පිරිනමමින් ශ්‍රී ලාංකිකයන්ට ජපානයේ රැකියා කිරීමට හැකි වන පරිදි සහයෝගීතා ගිවිසුමක් අත්සන් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 8)

75. අධ්‍යාපනික හුවමාරුව, වෘත්තීය පුහුණුව, ඒකාබද්ධ පර්යේෂණ සහ ආචාර්ය මණ්ඩල සංවර්ධනය ආවරණය වන පරිදි ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ මහජන චීන සමූහාණ්ඩුවේ සංස්කෘතික හා සංචාරක පරිපාලනය පිළිබඳ මධ්‍යම විද්‍යායතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 1)

### කාන්තා හා ළමා කටයුතු

76. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හරහා ක්‍රියාත්මක කරනු ලබන, මධ්‍යම මට්ටමේ කාන්තා ව්‍යවසායකයන්ට සහාය වීම, වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම, රැකියා විරහිත තරුණ කාන්තාවන්ට අවස්ථා ලබා දීම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසන වලින් පීඩාවට පත් අයට සහාය වීම අරමුණු කරමින්, අංශ 11 ක් පුරා 'කාන්තාවන් සවිබල ගැන්වීම ඉලක්ක කරගත් රු.මි. 200 ක වැඩසටහන' යටතේ වන වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2026 අනුමත කරන ලදී. (2026 ජූනි 8)

### පරිසර සහ ජනාධිපති යෝජනා සම්මත

77. සංවේදී මධ්‍යම කඳුකර වනාන්තර වලින් 34% ක් විනාශ වී තිබීමට සහ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ප්‍රධාන ගංගා ද්‍රෝනි හතකට සිදුවූ හානිවලට ප්‍රතිචාර වශයෙන් පිහිටුවීමට යෝජිත නව ඉහළ ජල පෝෂක කළමනාකරණ අධිකාරියක ආයතනික ව්‍යුහය සහ විෂය පථය නිර්වචනය කිරීම, නීති සම්පාදනය කිරීම සඳහා කෙටුම්පතක් සකස් කිරීම සහ අධිකාරය අදියර තුනකින් ස්ථාපනය කිරීම සඳහා තාක්ෂණික විශේෂඥ කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 8)

78. අමාත්‍යාංශ සහ ආයතන අතර පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සහ අනාගත නීති විධිවිධාන සඳහා සංකල්ප පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමට කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

79. හැඳුනුම්පත මගින් අනන්‍යතාවය තහවුරු කර ගැනීම සහ නොමැකෙන තීන්ත මගින් ඇඟිලි සලකුණු කිරීම යන කාර්යයන් දෙකම සිදුකිරීම අනවශ්‍ය සහ මිල අධික ලෙස සලකනු ලබන බැවින්, මැතිවරණ නීති පහක් (ජනාධිපතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා මැතිවරණ පනත, පළාත් පාලන මැතිවරණ ආඥාපනත සහ ජනමත විචාරණ පනත) සඳහා අනුමත කර ඇති නොමැකෙන තීන්ත වලින් ඡන්දදායකයන්ගේ ඇඟිලි සලකුණු කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

80. රාජ්‍ය අංශයේ දීර්ඝ කාලයක් පුරා පවතින වැටුප් හා විශ්‍රාම වැටුප් විෂමතා සඳහා විසඳුම් නිර්දේශ කිරීම, රාජ්‍ය සේවයට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යෝජනා කිරීම සහ තාක්ෂණික වශයෙන් බලගැන්වූ, පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීම පිණිස ජනාධිපති නියෝගයක් යටතේ එක් වසරක බලතල සහිත, රාජ්‍ය සේවක වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් (සාමාජිකයින් 15) ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූනි 22)

---

*වියාචනය - නීතිය හා සමාජ භාරය විසින් පවරන ලද පරිදි අර්මිසා ටෙගල්ගේ නීල කාර්යාලය විසින් සකස් කරන ලද මෙම ලියවිල්ල කෙටි සාරාංශයක් පමණි. මෙහි කිසිදු නෛතික විශ්ලේෂණයක් අඩංගු නොවන බැවින්, නීති උපදෙස් ලෙස මෙය කෙරෙහි විශ්වාසය නොතැබිය යුතුය.* tegal.lawchambers@gmail.com